සන්නස
SANNASA

6 මට හැඟෙන අයුරින් සිකොලෙජිය
rasikalogy.blogspot.com

# ජනතා විමුක්ති පෙරමුණ, හෙන්රි වර්ණකුලසූරිය, ලයනල් බෝපගේ සහ බලහත්කාරෙන් සමාජවාදය ගොඩ නැගීම!

හෙන්රි වර්ණකුලසූරිය විසින් රචනා කරන ලද "නාදුනන තුවක්කුකරුවාගේ කතාව" නම් ග්‍රන්ථය එළිදැක්වීමේ උත්සවයේ දී එහි ප්‍රධාන දේශකයා වූ මෙල්බර්න්වාසී ලයනල් බෝපගේ විසින් පැවැත්වූ කතාවේ මාතෘකාව ලෙස දැක්වුණේ මේ ලිපියේ මාතෘකාවේ කොටසක් ලෙස මා යොදාගෙන ඇති "බලහත්කාරයෙන් සමාජවාදය ගොඩ නැගිය හැකිද?" යන්නයි.

ඒ මාතෘකාව දුටු විට ම මගේ සිත අතීතයට ඇදී ගියේ ය. එයට හේතුව නම් අදින් වසර තිස් පහකට පෙර මා ලියූ දීර්ඝ කවියකින් මා ද මේ කරුණ ම මතු කර තිබීමයි. මා ලියූ ඒ කවියේ, මේ සටහනට සම්බන්ධ අවසාන පද කිහිපය මෙසේ ය.

අසාධාරණයෙ අඳුර බිඳින්නට
හිරු පායන තෙක් සිටි කාලය ඇති
බලහත්කාරෙන් හෝ හිරු පුබුදා
හෙට මුළු ලෝකය එළිය කළ යුතුය

මගේ පටු කාව්‍යමය භාෂාවෙන් හිරු උදා කිරීම සහ ලෝකය එළිය කිරීම යන්නෙන් මා එදා අදහස් කළේ සමාජවාදය ස්ථාපනය කර අසාධාරණය තුරන් කිරීම බව අමුතුවෙන් කිව යුතු නැත. එසේම මගේ කවියෙන් මා කළේ අද ප්‍රශ්නයක් නැගීම නොව සමාජ අසාධාරණයේ ගනඳුර බිඳින්නට පැහැදිලි විසඳුමක් ලෙස බලහත්කාරෙන් හෝ හිරු පිබිදවීම ඉදිරිපත් කිරීමයි.
එනම්, බලහත්කාරෙන් සමාජවාදය උදා කළ යුතුය කියා කීමයි.

දැන්, මගේ මේ කවිය, හෙන්රි වර්ණකුලසූරිය ගේ පොත් එළිදැක්වීමේ උත්සවයේදී ලයනල් බෝපගේ විසින් කරන්නට යන කතාවේ මාතෘකාවට සම්බන්ධ වන්නේ කෙසේද විස්තර කළ යුතුය.
ලයනල් බෝපගේ යනු 1977 න් පසුව ජනතා විමුක්ති පෙරමුණ දේශපාලන පක්ෂයක් ලෙස සංවිධානය වූ කාලයේ සිටම එහි ප්‍රධාන ලේකම් විය. මා ඔහු දැක ඇත්තේ දෙවරකි. ඒ මුල්ම අවස්ථාව එකල ජාතික ප්‍රශ්නය ලෙස හැඳින්වුණු ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නය පිළිබඳව තම පක්ෂයේ ප්‍රතිපත්ති පැහැදිලි කිරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ දී පැවැත්වූ දේශනයක දී ය.

ඉන් වසර එකහමාරකට පමණ පසුව රටේ ඇතිකළ ජූලි කලබලය දඩමීමා කරගෙන, එවකට පැවති යූඇන්පී රජය විසින් ජනතා විමුක්ති පෙරමුණ තහනම් කරන ලදී.
එයින් සුළු කලකට පසුව ලයනල් බෝපගේ පක්ෂයේ ප්‍රධාන තනතුරෙන් ඉවත් වූ බව ආරංචි විය. එයට හේතුව වූයේ නන්දසිරි විජේවීර සහ අනෙකුත් පක්ෂ නායකයින් විසින්, සිංහල ජාතිවාදීන්ගේ කැමැත්ත දිනා ගැනීම පිණිස අතිශය අවස්ථාවාදී ලෙස ජාතික ප්‍රශ්නය පිළිබඳ පක්ෂයේ ප්‍රතිපත්තිය වෙනස් කර දේශප්‍රේමය නම් බැටළුහමකින් වසා ජාතිවාදයේ කුෂ්ඨ රෝගය සාදා ගැනීම බව මගේ අදහසයි.

කලකට පසු ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය කළ ලයනල් බෝපගේ එහි ෆෙඩරල් රජයේ ආයතනයක මැවිසුරුවකු ලෙස කලක් සේවය කර විශ්‍රාම ලබා දැන් මෙල්බන් නගරයේ ජීවත් වෙයි. මා දෙවන වරට ඔහු දුටුවේ සහ මුල්වරට වචන කිහිපයක් හෝ කතා කළේ පසුගිය වසරේ දිනක මා සම්බන්ධ සිඩ්නි කොළඹ රංග ව්‍යාපෘතිය නම් නාට්‍ය කණ්ඩායම සමග මෙල්බර්න් නගරයට ගිය අවස්ථාවේ දී ය.

බලහත්කාරෙන් හෝ හිරු පුබුදා ලෝකය එළිය කිරීම පිළිබඳ පෙර කී කවිය මා ලියා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨ කලා කවයේ පළ කළේ 1984 මැද භාගයේ දී ය. ඒ සමගම විශ්වවිද්‍යාලය කුරුටු ගී සම්ප්‍රදාය රකිමින්, ඇන්ඩ්‍රූස් හෙල් ශාලාවේ ඉහළ මාලයේ හාඩ්බෝඩ් පුවරුවක ද එය හුණු කූරකින් ලියා තැබුවෙමි.

ඊළඟ වසරේ දිනක මේ කාමරයට පැමිණි ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ අයෙකු විසින් (මේ ආනන්ද ඉඩමේගම විය හැක), ඔහු පිළිගන්නා ජනතා විමුක්ති පෙරමුණේ මතයට සාපේක්ෂව, මේ කවියේ අඩංගු අදහස දේශපාලනිකව සාවද්‍ය බව කියා ඇත. එහි දී ඇතිවුණු සාකච්ඡාවේ දී කවියේ නිර්මාපකයා පිළිබඳව විපරම් කෙරී ඇති අතර, ඒ මා බව දැන, කවියේ අදහස සම්බන්ධයෙන් මා සමග සාකච්ඡා කළ යුතු බවට යෝජනා වී ඇත.

මා එම යෝජනාවට කැමැත්ත පළ කළ පසු, ජනතා විමුක්ති පෙරමුණ විසින් මට නිවැරදි දේශපාලන චින්තනය වටහා දී, හැකි නම් මට (පසු කලෙක මා දැන ගත් වචනයකින් කියනවා නම්) කොක්ක ගැසීම සඳහා එවන ලද්දේ, අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු තනතුරෙන් පසුව, ඒ වන විට පූර්ණකාලීනව පක්ෂ දේශපාලනයේ නිරතුව සිටි උපාලි ජයවීරව යි.
එදා මගේ කාමරයේ දී, දෙපැයක් පමණ

කාලයක් තිස්සේ උපාලි ජයවීර උත්සාහ කළේ ජනවාර්ගික ප්‍රශ්නය පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණේ ස්ථාවරය පැහැදිලි කිරීමටත්, උතුරේ තරුණ කණ්ඩායම් විසින් ආරඹා තිබූ සන්නද්ධ අරගලය ජවිපෙ මතයට අනුව වැරදි එකක් වන්නේ ඇයි දැයි කීමටත්, බලහත්කාරයෙන් හිරු පුබුදුවාලිය නොහැකිය, එසේ කිරීම වැරදිය, එනිසා මා විසින් පෙර කී කවියෙන් මතු කරන අදහස ප්‍රතිගාමීය යන කාරණා මට කියා පැහැදිලි කරදීමටත් ය.

ඒ නිෂ්ඵල උත්සාහය අවසානයේ ඔහු පිටත් වී ගියේ නැවත දිනක හමු වී කතා කරමු යැයි පවසමින් වුව ද, මට උපාලි ජයවීරව යළි කිසි දිනක මුණ ගැසුණේ නැත. මා වැනි ගල් ඉබ්බන් කෙසේ වුවද, උපාලි ජයවීරලාගේ ජාතිවාදී කයිවාරු ඇමට අසුවන ඕනෑ තරම් සාලයන් සහ සුඩයන් ඒ මුල් කාලයේ වුව ද සිටින්නට ඇත.
එහි අන්තර්ගත අදහස නිසාම, මගේ කවියේ පෙර සඳහන් කළ අවසාන පද හතරට මා කෙතරම් ඇලුම් කළේ ද යත් මගේ සංස්කරණයෙන් මුද්‍රණය වුණු විශ්වවිද්‍යාල ශිෂ්‍ය සඟරාවක කතුවැකියේ අවසානයේ මම ඒ සිව්පදය ඇතුළත් කළෙමි. ඒ සඟරාව මුද්‍රණය කෙරුණේ එවකට පැවති යූඇන්පී ආණ්ඩුව විසින් පේරාදෙණියේ පද්මසිරි අබේසේකර සහ කොළඹ රෝහණ රත්නායක යන සහෝදර විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් දෙදෙනා වෙඩි තබා මරා දමා වසරක් ගතවීම සනිටුහන් කිරීමට 1985 ජුනි මාසයේ දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ අප විසින් දියත් කළ වැඩ සටහනේ එක් අංගයක් ලෙස බව ද සඳහන් කළ යුතු ය.

මේ අනුස්මරණ රැස්වීම සඳහා විශ්වවිද්‍යාලයේ පාලනාධිකාරිය නියෝජනය කරමින් උපකුලපති පානබොක්කේ ද, වෙනත් විශ්වවිද්‍යාලවල ශිෂ්‍යයින් නියෝජනය කරමින් ශිෂ්‍ය නියෝජිතයින් ද සහභාගී වූහ. ඒ අතර කොළඹ විශ්වවිද්‍යාලයේ ස්ථාපිත වී තිබුණු ස්වාධීන ශිෂ්‍ය සංගමයේ නියෝජිතයෙකු ද වූ බව මගේ මතකයයි.

විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගම් තහනම් කර තිබුණු තත්වය යටතේ වුව ද, ඒ සමයේ දී, සෑම විශ්වවිද්‍යාලයකම පාහේ ශිෂ්‍යයින් අතර නායකත්වය හිමිකරගෙන සිටියේ ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ සමාජවාදී ශිෂ්‍ය සංගමය විසිනි. අනෙකුත් දේශපාලන මතවාද දරණ ශිෂ්‍යයින් අනුගමනය කළේ නිහඬව සිටීමේ ප්‍රතිපත්තියකි. තත්වය වෙනස් වූයේ ස්වාධීන ශිෂ්‍ය සංගමය විසින් සෑහෙන ප්‍රමාණයකට බලය රඳවා ගෙන සිටි කොළඹ විශ්වවිද්‍යාලයේ දී ය. මෙනිසා, ජනතා විමුක්ති පෙරමුණ සහ එහි එවකට විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංවිධානය වූ සමාජවාදී ශිෂ්‍ය සංගමය තම පරම හතුරා ලෙස සැලකුවේ කොළඹ විශ්වවිද්‍යාලයේ ස්වාධීන ශිෂ්‍ය සංගමයයි. එය පසු කලක, ජීවිත සෑහෙන සංඛ්‍යාවක් අකාලයේ විනාශ කළ නයිමුගටි හටනක් විය. ඒ මිනීමරු හතුරුකමේ මුල් අවධිය එකල ප්‍රදර්ශනය වුණු අවස්ථා දෙකක් පිළිබඳව මට පුද්ගලික අත්දැකීම් ඇත.
ඉන් එක් අවස්ථාවක් නම්, කොළඹ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගම් කාර්යාලයේ දී පැවති අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ (අවිශිබම) රැස්වීමකි. මේ රැස්වීමේ මූලාසනය දැරුවේ එවන විට දෙවසරක් තිස්සේ තම ශිෂ්‍යභාවය තහනම් කිරීමකට ලක් වී සිටි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨ ශිෂ්‍ය රංජිතන් ගුණරත්නම් විසින් වන අතර රැස්වීමේ වාර්තාව සටහන් කළේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් එම රැස්වීමට සහභාගී වී සිටි එකම නියෝජිතයා වූ මා විසිනි.
කොළඹ විශ්වවිද්‍යාලයේ ස්වාධීන ශිෂ්‍ය සංගමයේ එවකට නායක දයා පතිරණ අමතරව, ඒ රැස්වීමට සහභාගී වුණු අය අතරින් මගේ මතකයේ රැඳී ඇති දෙදෙනෙකු වන්නේ පොදු ශිෂ්‍යයන් නියෝජනය කළා යැයි පැවසුණු තඹරලුවේ ජිනරත්න සහ විද්‍යා හෝ නීති පීඨය නියෝජනය කළා යැයි පැවසුණු සරත් විදිරිසිංහ ය. ජවිපෙ අනුගාමිකයින් වූ ඔවුන් දෙදෙනා එහි පැමිණි සිටියේ කවර අරමුණින් ද යන්න පැහැදිලි වූයේ ඔවුන් කතා කරද්දී ය. එහි දී දීර්ඝ මෙන්ම විෂ පිරි කරුණු දැක්වීම් සමගින් ඔවුන් ඉල්ලා සිටියේ, අධ්‍යයන කටයුතු නිසි පරිදි නොකිරීම නිසා විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අහෝසි වී සිටි දයා පතිරණට, අවිශිබම රැස්වීමට සහභාගිවීමට නීත්‍යානුකූල අයිතියක් නොමැති බැවින් ඔහුව මේ සභාවෙන් නෙරපා හරින ලෙස ය. ඔහුට පක්ෂව කරුණු දැක්වීමට කිසිවෙකු නොසිටි අතර, බහුතර අදහස පිළිගත් දයා පතිරණ සභාවෙන් නික්මී යන දර්ශනය වසර තිස් හතරකට පසුවත් මගේ මතකයේ හොඳින් රැඳී ඇත.

ස්වාධීන ශිෂ්‍ය සංගමය කෙරෙහි ජවිපෙ ශිෂ්‍ය සංගමයේ පැවති වෛරය පැහැදිලිවම දෘශ්‍යමාන වූ මා දුටු දෙවන අවස්ථාව නම් ඒ වසරේ අවසාන කාර්තුවේ දී, ස්වාධීන ශිෂ්‍ය සංගමයේ නායක දයා පතිරණ සහ සාමාජික ධර්මසිරි මහනුවර නගරයේ පැවැත්වුණු කුමක් දෝ දේශපාලන සාකච්ඡාවකට සහභාගීවීම සඳහා පැමිණ, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අක්බාර් ශාලාවේ රැයක් ගත කළ අවස්ථාවේ, ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ පිරිස් අතිශය දරුණු ලෙස කලබල වූ ආකාරයයි. ස්වාධීන ශිෂ්‍ය සංගමයේ දේශපාලනය අති ධාවනකාරී බිහිසුණු එකක් බව ද, එය ශිෂ්‍ය ව්‍යාපාරයකට නොගැලපෙන බව ද, මේ ජවිපෙ හිතවාදීන් ගේ මතය විය. දයා පතිරණ සහ ධර්මසිරි දෙදෙනා එක් රැයක් නවාතැන් ගත් අක්බාර් ශාලාවේ කාමරය හිමි මා මිත්‍ර ස්ටැන්ලි මොරේමඩට ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටු රැස්වීමක දී අයුතු ලෙස චෝදනා නැගීමට ද ජයශ්‍රී සහ නිශ්ෂ ඇතුළු ජවිපෙ හිතවාදී සිසුන් කටයුතු කළහ.
ඔවුන් එලෙස චාලධිය ගිනි ගත්තා සේ කටයුතු කිරීමට හේතුව වූයේ කොළඹ විශ්වවිද්‍යාලයේ මෙන් තමන්ට තර්ජනයක් වෙන ආකාරයේ



30 වන පිටුට